# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# අනුහුරු ප්‍රශ්න පත්‍රය
# බුද්ධ ධර්මය 1
**කාලය පැය දෙකයි**

ප්‍රශ්න සියල්ලට නිවැරදි හෝ ආසන්න පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයේ ඇති අදාල අංකය රවුම් කරන්න

---

1. අප පිරිවෙණේ කලා උළෙල පසුගිය දා ඉතා චාම් ව නමුත් අභිමානවත් අයුරින් පැවැත්වුණි. එහි තිබූ ත්‍රිපිටක ධර්ම කුටියේ බුදුරදුන්ගේ නව අරහාදී බුදුගුණයන් සම්බන්ධව පුවරුවක් ප්‍රදර්ශනය කොට තිබුණි. කුටිය භාර සෝමානන්ද හිමියන් පැමිණි සෑම දෙනාට ඒ පිළිබඳ විස්තර කර දුන්නේය. එහිදී පහළ වූ අදහස් කීපයක් පහතින් දක්වා ඇත. එයින් නොගැලපෙන කරුණ වන්නේ,
   1. චතුරාර්ය සත්‍යය තමා විසින් පරෝපදේශ රහිතව අවබෝධකරගත් බැවින් 'බුද්ධ' නම් වේ.
   2. සුන්දර වදන් පවසන බව 'සුගත' බුදුගුණයෙන් පැහැදිලි වේ.
   3. ඕකාස ලෝකය පිළිබඳ දන්නා බවත් 'ලෝකවිදූ' බුදුගුණයෙන් කියවේ.
   4. 'භගවා' ගුණයෙන් භග ධර්මයන් පිළිබඳ විස්තර කොට ඇත.
   5. සේඛ සූත්‍රයේ සඳහන් වන්නේ බුදුරදුන්ගේ 'විජ්ජාචරණ' ගුණය පිළිබඳවයි.

2. බුදුරදුන් සතර ඉරියව්වේ ම එළඹ සිටි ඤාණයෙන් යුක්ත බවට සමාජයේ ඇති අදහස පිළිබඳ දන්වා සිටි අවස්ථාවේ එවැනි ඤාණයක් නොමැති බවත් 'යමෙක් මට ශ්‍රමණ භවත් ගෞතමයන් ත්‍රිවිද්‍යාවෙන් යුක්ත යැයි' කියන්නේ නම් එය මා පිළිබඳ මැනවින් කීමක් ලෙස පෙන්වා දුන්නේය. මේ පැහැදිලි කිරීම අඩංගු වන මූලාශ්‍ර දේශනාව වන්නේ,
   1. මහාවච්ඡගොත්ත සූත්‍රයයි.
   2. අරියපරියේසන සූත්‍රයයි.
   3. තේවිජ්ජ වච්ඡගොත්ත සූත්‍රයයි.
   4. අම්බට්ඨ සූත්‍රයයි.
   5. අග්ගිවච්ඡගොත්ත සූත්‍රයයි.

3. 'මහණෙනි, දැන් තොපට කියමි. සියලු සංස්කාර ධර්මයෝ විනාශවන ස්වභාව ඇත්තාහුය. ප්‍රමාද නොවී සම්පාදනය කරව්' බුදුරදුන්ගේ මෙම ප්‍රකාශය පිළිබඳ දැරිය හැකි සුදුසු ම නිගමනය ලෙස දැක්විය හැක්කේ,
   1. භික්ෂූන් වහන්සේලා දිරිගැන්වීම සඳහා සිදුකළ ප්‍රකාශයක් ලෙසයි.
   2. භික්ෂූන් වහන්සේලාට යමක් සිතන්නට කළ පෙළඹවීමක් ලෙසයි.
   3. සමස්ත ධර්මයේ ම සම්පිණ්ඩනයක් ලෙසයි.
   4. බුදුරදුන්ගේ අන්තිම බුද්ධ වචනය ලෙසයි.
   5. ආනන්ද හිමියන් දුක් වූ නිසා ඔහු කේන්ද්‍රකොට සිදුකළ ප්‍රකාශයක් ලෙසයි.

4. බුදුරදුන් පුද්ගල වෛමත්තතාව (විවිධත්වය) දැනගෙන අනුශාසනා කරන සේක. ඇතැම් අවස්ථාවන්හි යම් යම් කාරණා විවිධ පුද්ගලයන් විමසූ අවස්ථාවන්හිදී නිහඬව සිටි අවස්ථා ද බොහොමයක් ඇත. එම දේශනා දක්වා ඇත්තේ 'ඨපනීය' වශයෙනි. එම ව්‍යාකරණය භාවිතා කළ අවස්ථාවක් ලෙස සඳහන් කළ හැක්කේ,
   1. අභයරාජ කුමාරයා ගිලින්නටත් වමාන්නටත් බැරි ප්‍රශ්නයක් සකස් කරගෙන පැමිණි අවස්ථාව.
   2. මාරයා රාජ්‍ය පාලනය කරන ලෙස බුදුරදුන්ට ඇරයුම් කරන්නට පැමිණි අවස්ථාව.
   3. වච්ඡගොත්ත පිරිවැජියා ප්‍රශ්න දහයක් සකස්කරගෙන බුදුරදුන් මුනගැසුණු අවස්ථාව.
   4. උපාලි ගෘහපතියා ත්‍රිදණ්ඩය පිළිබඳ බුදුරදුන්ට ප්‍රශ්න යොමුකළ අවස්ථාව.
   5. අජාසත්ත රජතුමා ශ්‍රමණබවේ ඵල විමසන්නට ජීවක වෛද්‍යවරයා සමග පැමිණි අවස්ථාව.

අනුහුරු ප්‍රශ්න පත්‍රය උසස් පෙළ බුද්ධ ධර්මය

5. 'මහණ, ඉදින් තොපට බරක් නොවේ නම්, කුම්භකාර ශාලාවෙහි එක් රැයක් වාසය කරමි. "ඇවැත්නි, කුම්භකාර ශාලාව ඉඩ ඇත්තේය. ආයුෂ්මත් තෙමේ සැපසේ වාසය කෙරේවා' පුක්කුසාති තවුසා හමුවීමට ගිය අවස්ථාවක ඇති වූ දෙබසක් ඉහතින් දක්වා ඇත. මේ සංවාදයෙන් අර්ථවත් වන්නේ බුදුරදුන් සතු,
   1. අනායමත ඉවසීමයි.
   2. යථාකාරී තථාවාදීත්වයයි.
   3. සරල භාවයයි.
   4. නිහතමානීත්වයයි.
   5. ආගමික සහනශීලීත්වයයි.

6. විනය පිටකයේ සැකැස්ම යන මැයෙන් ශාස්ත්‍රීය සඟරාවක් සඳහා ලිපියක් ලියා තිබූ එක්තරා විද්වතෙක් විනය පිටකයට අදාල කොටස් පිළිබඳ පැහැදිලි විවරණයක් දක්වා තිබුණි. එහි මහාවග්ග පාලිය සහ එහි අන්තර්ගතය පිළිබඳව ද විස්තර දක්වා තිබුණි. මහාවග්ග පාලිය පිළිබඳ එහි දැක්වුණු විස්තර අතර තිබිය නොහැකි යැයි සිතිය හැකි කාරණාවක් ලෙස අනුමාන කළ හැක්කේ,
   1. 'බුදුරදුන්ගේ ධර්ම ප්‍රචාරය පිළිබඳ විස්තර එහි අඩංගු වේ.' යන්නයි.
   2. 'භද්දවග්ගිය කුමාරවරු බුදුරදුන් හමුවූ පුවත දැක්වේ.' යන්නයි.
   3. 'පැවිදි උපසම්පදා පිළිබඳ විනය පැනවීම් එහි අන්තර්ගත වේ.' යන්නයි.
   4. 'රජගහනුවර සිටුවරයා ආරාම පූජා කිරීම සම්බන්ධ පුවත ඇත.' යන්නයි.
   5. 'ආචාර්ය උපාධ්‍යාය පැනවීම් පිළිබඳ විනය පිළිවෙත් එහි විස්තර වේ.' යන්නයි.

7. **යං එත්ථ වුද්ධි මත්තෝ සලක්ඛණා පූජිතා පරිච්ඡින්නා**
   **වුත්තාධිකා ච ධම්මා ..................** මේ දැක්වෙන්නේ අභිධර්මය පිළිබඳ නිර්වචනය කර ඇති 'සමන්ත පාසාදිකාවේ' සඳහන් පැදි පේළි කීපයකි. මෙම ගාථාවේ උණ පූරණය කිරීම සඳහා නිවැරදිව ම භාවිතා කළ හැකි ගාථා පාඨය ලෙස දැක්වෙන්නේ,
   1. 'තේන වුච්චති යෝ අභිධම්මෝ' යන්නයි.
   2. 'අක්ඛාතෝ තේන අභිධම්මෝ' යන්නයි.
   3. 'අභිධම්මන්ති පවුච්චිතී' යන්නයි.
   4. 'අභිධම්මෝති වුත්තාදිච්චබන්ධුනා' යන්නයි.
   5. 'අභිධම්මෝ තේන අක්ඛාතෝ' යන්නයි.

8. පහත දක්වා ඇත්තේ සූත්‍ර පිටකයේ 'දීඝ නිකාය' පිළිබඳ විස්තර සඳහන් වාක්‍ය කීපයකි. එයින් දීඝ නිකාය හා නොගැලපෙන වාක්‍යය වන්නේ,
   1. බුදුරදුන් දේශිත දීර්ඝ දේශනා ඇතුළත් වන්නේ දීඝ නිකායේ ය.
   2. බුදුරදුන් කළ දුෂ්කර ක්‍රියාව දැක්වෙන 'මහා සීහනාද සූත්‍රය' දීඝ නිකායට අයත් වේ.
   3. දීඝ නිකාය ආරම්භ වන්නේ බ්‍රහ්මජාල සූත්‍රය මුල්කොට ගෙනයි.
   4. බුදුරදුන් දේශිත සතර මහාපදේශ දැක්වෙන සූත්‍රය ඇත්තේ දීඝ නිකායේ ය.
   5. දීඝ නිකායේ අන්තර්ගතය සූත්‍ර තිස් හතරකට සීමා වී ඇත.

9. "**චිත්තසංකිලේසා, භික්ඛවේ, සත්තා සංකිලිස්සන්ති; චිත්තවෝදානා සත්තා විසුජ්ඣන්ති**." ඉහත දැක්වෙන ප්‍රසිද්ධ ධර්ම පාඨය අඩංගු වන මූලාශ්‍රය වන්නේ,
   1. සාමඤ්ඤඵල සූත්‍රයයි.
   2. අරියපරියේසන සූත්‍රයයි.
   3. ගද්දුලබද්ධ සූත්‍රයයි.
   4. සම්බහුල සූත්‍රයයි.
   5. අචේල කස්සප සූත්‍රයයි.

10. 'මහණෙනි ලෝකයේ පර්යේෂණ ක්‍රම දෙකකි. එනම්, ආර්ය පරියේෂණයත් අනාර්ය පරියේෂණයත් ය.' මෙම ප්‍රකාශය තුළ ඇත්තේ බුදුදහම යනු අනාර්ය පරියේෂණයෙන් බැහැර වී ආර්ය පරියේෂණය මත ගොඩ නැගුණු චින්තාවක් බවයි. මෙමගින් විශේෂයෙන් බැහැර වන්නේ,
    1. 'බුදුදහම විමංසනයට මූලිකත්වය ලබා දී ඇත.' යන්නයි.
    2. 'බුදුදහම සැමවිට ම විවෘත දර්ශනයකි.' යන්නයි.
    3. 'අනුපූර්ව ක්‍රමවේදයක් ඔස්සේ ගවේෂණය කළ යුත්තකි.' යන්නයි.
    4. 'ස්වප්‍රත්‍යක්ෂයට පමණක් ම ගෝචර නොවන්නක් වීමයි.' යන්නයි.
    5. 'අන්ධානුකරණයෙන් නිවන් ලැබිය නොහැක.' යන්නයි.

11. පරිබ්‍රාජක සම්ප්‍රදාය බුද්ධ කාලීනව බහුල වශයෙන් සමාජගත වී සිටියහ. විවිධ පරිබ්‍රාජකයන් බුදුරදුන් හා සාකච්ඡා සිදුකොට උපාසකයන් බවට පත් වූ පුවත් ද අසන්නට ලැබේ. අන්‍ය ලබ්ධිකයන් වුව ද ගැඹුරු ඥාණ සම්භාරයකින් ද යුත් පරිබ්‍රාජකයන් ඒ අතර සිට ඇත. ඔවුන් පිළිබඳ පහත දක්වා ඇති නිගමන අතරින් ගැලපෙන නිගමනයක් වන්නේ,
    1. ඔවුන් නග්න පිරිසක් ලෙස වාසය කොට ඇති බවයි.
    2. වාදයෙන් පරාජය වූ පසු ඔවුන්ගේ අනුගාමිකයන් බවට පත්වීමයි.
    3. අධික මාන්නයෙන් යුක්තව වාසය කළ පිරිසක් වීමයි.
    4. පවත්තඵලභෝජී ව වනගතව වාසය කිරීමයි.
    5. කාමසුඛල්ලිකානුයෝගයට දැඩි ලෙස ඇලුම් කළ පිරිසක් වීමයි.

12. "**තේන ඛෝ පන සමයේන ඒකසට්ඨී ලෝකෙ අරහන්තෝ හොන්ති.**" මහාවග්ග පාලියට අනුව බෞද්ධ භික්ෂු සංස්ථාවේ සංවිධානය පිළිබඳ ඉහත ප්‍රකාශයෙන් ගම්‍ය වේ. පහත දැක්වෙන නාමයන් අතරින් මේ කණ්ඩායමට අයත් පිරිසක් ලෙස දැක්වෙන්නේ,
    1. භද්දවග්ගිය කුමාරවරු ඇතුලු පිරිස ය.
    2. කෝලිත, උපතිස්ස දෙදෙනා ඇතුලු පිරිස ය.
    3. අංගුලිමාල තෙරුන් ය.
    4. තුන් බෑ ජටිලයන් ය.
    5. යසකුල පුත්‍රයා ඇතුලු පිරිස ය.

13. භික්ෂුණී සසුන ඇරඹුණේ භික්ෂු ශාසනය ආරම්භ කොට වසර පහක් ගත වීමෙන් අනතුරුව මහා ප්‍රජාපතී ගෝතමියගේ ඉල්ලීම හා ආනන්ද තෙරුන්ගේ මැදිහත් වීම තුළයි. ඒ සඳහා 'යාවජීව' ඉක්මවිය නොහැකි ගරුධර්ම අටක් පනවන්නට වූහ. සසුනේ අනාගත පැවැත්ම උදෙසා පනවන්නට යෙදුණු එවැනි එක් ගරුධර්මයක් වන්නේ,
    1. 'භික්ෂූන් සමග එක පෝය ගේ තුළ පෝය කළ යුතුය.' යන්නයි.
    2. 'ආගමික කටයුතු වල දී භික්ෂූන් පසුපසින් ගමන් කළ යුතුය.' යන්නයි.
    3. 'භික්ෂූන් සමීපයේ සිටිමින් බණ භාවනා කටයුතු කළ යුතුය.' යන්නයි.
    4. 'දෙවසරක් ශික්ෂා මානවිකාවන් ලෙස සිට උපසම්පදා විය යුතුය.' යන්නයි.
    5. 'භික්ෂූන් නොමැති ප්‍රදේශයක ම වස් වාසය කළ යුතුය.' යන්නයි.

14. "**සම්බාධෝයං සරාවාසෝ, රජස්සායතනං ඉති;**
**අබ්භෝකාසෝව පබ්බජ්ජා, ඉති දිස්වාන පබ්බජි**" ගිහිගෙය සම්බාධක සහිතය. කෙලෙස්වලට ආකරයකි. පැවිද්ද එළිමහනක් වැනිය. එය දැක පැවිදි වීමි. ගාථාවේ දැක්වෙන මෙය කාගේ අදහසක් ද?
    1. යසකුල පුත්‍රයාගේ ය.
    2. සිද්ධාර්ථ කුමාරයාගේ ය.
    3. භද්දවග්ගිය කුමාරවරුගේ ය.
    4. සභිය පිරිවැජියාගේ ය.
    5. පුක්කුසාති තරුණයාගේ ය.

15. සාමණේර පැවිද්දට අදාල ශික්ෂා රාශියක් බුදුරදුන් පෙන්වා දී ඇත. 'දසසිල්, දසසිඛ, සදපරිජි, දස නාසනා, දස දඬුවම්' ආදී වශයෙනි. සාමණේරයෙකු සිවුරු නොහරවා දඬුවම් ලබා දීමෙන් හික්මවන කොටස 'දස දඬුවම්' ලෙස දක්වා ඇත. ඒ අනුව සාමණේරයෙකු දඬුවමට යටත් වීමට බලපාන කරුණක් වන්නේ,
    1. පරපණ නැසීම.
    2. මිත්‍යාදෘෂ්ටික වීම.
    3. භික්ෂුණී දූෂකයෙකු වීම.
    4. මත්පැන් පානය කිරීම.
    5. භික්ෂූන් ආවාසයෙන් නෙරපීමට උත්සාහ කිරීම.

16. බ්‍රාහ්මණ දර්ශනය යනු මිනිසා ජාති වශයෙන් බෙදා බමුණු ආධිපත්‍යය ඉස්මතු කරමින් සිදුකළ පාලන ක්‍රමයයි. සියලු වරප්‍රසාද බමුණන් සතුකර ගනිමින් සෙසු වර්ණයන්ට අයිතිවාසිකම් සීමා කරන්නට වූහ. එයිනුදු 'පංචම' යනුවෙන් සඳහන් කණ්ඩායමට කිසි වරප්‍රසාදයක් ලබා නුදුන් බව බ්‍රාහ්මණ ග්‍රන්ථයන්හි දක්වා ඇත. එසේ වරප්‍රසාද අහිමි කළ පංචම කුලයට අයත් කණ්ඩායමක් වන්නේ,
    1. පුක්කුස
    2. වාණිජ
    3. සිප්පික
    4. දොවාරික
    5. කස්සක

17. බ්‍රාහ්මණ ඉගැන්වීම් බුදුදහමේ විවිධ පරියායෙන් ප්‍රතික්ෂේප කොට ඇත. ඒ සඳහා බොහෝ මූලාශ්‍ර කරුණු ගෙනහැර දැක්විය හැකිය. ඒ අනුව සත්ත්වයෙක් බිහිවීමට අදාල වූ කාරණා තුනක් බුදුදහම පෙන්වා දී ඇත. එනම්, '**මව සෘතුවීම. මාපිය සංවාසය. ගන්ධබ්බයෙකුගේ පැමිණීම**' යනුවෙනි. එම නිසා මහබඹුගේ මුවින් උපන්නා යැයි කීම සහමුලින් ම ප්‍රතික්ෂේප වී යයි. බමුණන්ගේ නිර්මාණවාදී සංකල්පය බැහැර කරන මෙම ඉගැන්වීම අපට හමුවන්නේ,
    1. අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
    2. මධුර සූත්‍රයේ ය.
    3. අස්සලායන සූත්‍රයේ ය.
    4. මහාතණ්හාසංඛය සූත්‍රයේ ය.
    5. වාසෙට්ඨ සූත්‍රයේ ය.

18. ක්‍රි.පූ හයවන සියවසේ බුදුරදුන් පහළ වන අවධියේ භාරතයේ ප්‍රසිද්ධියට පත් ශ්‍රමණ කණ්ඩායම ලෙස දැක්වෙන්නේ 'ෂට් ශාස්තෘවරුය.' සුවිශේෂී සමාජ පෙරළියක් බමුණන්ට විරුද්ධව සිදු කිරීමට මොවුන්ට හැකි වූහ. ඔවුන් විසින් සමාජයට මුදාහැරි මතවාදයක් වූයේ,
    1. ඉස්සර නිම්මාණ වාදයයි.
    2. අහේතු අප්පච්චය වාදයයි.
    3. සයංකත වාදයයි.
    4. අනාත්ම වාදය
    5. පරංකත වාදය

19. ෂට් ශාස්තෘවරුන්ගේ දර්ශනයන් බුදුදහම බැහැර කරයි. සමාජ සදාචාරය බිඳ වැටීමට එම ඉගැන්වීම් පාදක වේ. යම් ප්‍රමාණයක උපයෝගිතාවක් පෙනුනත් නිගණ්ඨ දර්ශනය ද ප්‍රායෝගික වශයෙන් ප්‍රගුණ කිරීට අවකාශ මදය. ඔවුන් කරන ව්‍රත ක්‍රම ඇතැම් අවස්ථාවන්හි බුදුරදුන්ගේ විවේචනයට ලක් වී ඇත. එවන් විවේචනයක් දැක්වෙන්නේ,
    1. සාමඤ්ඤඵල සූත්‍රයේ ය.
    2. උදුම්බරික සීහනාද සූත්‍රයේ ය.
    3. මහාසීහනාද සූත්‍රයේ ය.
    4. නානාතිත්ථිය සූත්‍රයේ ය.
    5. දේවදහ සූත්‍රයේ ය.

20. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම 'අග්ගඤ්ඤ සූත්‍රයේ' මැනවින් පැහැදිලි කරයි. විවිධ වර්ණයන් ඇතිවූයේ මැවීමකින් නොව සමාජ අවශ්‍යතා මත බව එහිදී අවධාරණය කොට ඇත. අග්ගඤ්ඤ සූත්‍රය පරිශීලනය කිරීමේ දී ප්‍රසිද්ධ උධෘත රාශියක් අපට මුණගැසෙයි. එවන් සුවිශේෂී උධෘතයක් වන්නේ,
    1. 'අත්තදීපා විහරථ භික්ඛවේ අත්තසරණා නාඤ්ඤ සරණා.'
    2. 'ධම්මදායාදා හෝථ, භික්ඛවේ මා අමිස දායාදා.'
    3. 'ධම්මෝ හි, සෙට්ඨෝ ජනේතස්මිං, දිට්ඨේ චේව ධම්මේ අභිසම්පරායඤ් ච.'
    4. 'යෝ ධම්මං පස්සති සෝ මං පස්සති. යෝ මං පස්සති සෝ ධම්මං පස්සති.'
    5. 'නාහං භික්ඛවේ ආදිකේනේ ව අඤ්ඤාරාධනං හෝති.'

21. ශික්ෂා පැනවීමට පෙර යුගය හඳුන්වන්නේ 'පඨමාභිසම්බුද්ධ යුගය' ලෙසයි. බුදුරදුන් එම වකවානුවේ භික්ෂූන් හික්මවා ඇත්තේ අවවාදයෙනි. එය දක්වා ඇත්තේ 'ඕවාද ප්‍රාතිමෝක්ෂය' යනුවෙනි. බුදුරදුන් දේශිත එම ඕවාද ප්‍රාතිමෝක්ෂයට අදාල නොවන කරුණක් වන්නේ,
    1. නිතර කුසලය දියුණු කළ යුතුය.
    2. ප්‍රාතිමෝක්ෂ සංවරයෙන් යුක්ත විය යුතුය.
    3. ආහාරයේ ප්‍රමාණය දැනගත යුතුය.
    4. සේඛියා ආරක්ෂා කළ යුතුය.
    5. අනුන් වෙහෙසන්නා ශ්‍රමණයෙක් නොවේ.

22. දහම් දෙසීමට කළ දිරිගැන්වීම්වල එක් ක්‍රියාමාර්ගයක් වන්නේ ශ්‍රාවක දේශනා අගයුමට ලක් කිරීමයි. ධර්ම ප්‍රචාරය සාර්ථක වීමට එය බෙහෙවින් ඉවහල් විය. බුදුරදුන් වරක් ආනන්ද හිමියන්ගේ දේශනාවක් අවසානයේ 'ආනන්ද, නුඹ කපිලවස්තු ශාක්‍යයන්ට සේඛ ප්‍රතිපදාව මැනවින් දේශනා කළේය.' යනුවෙන් ඇගයුමට ලක් කළේය. මෙහි දැක්වෙන **සේඛ ප්‍රතිපදාවෙන්** අර්ථවත් කරන්නේ,
    1. අෂ්ඨ විද්‍යාවෝ ය.
    2. පංච ශීලයයි.
    3. ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.
    4. සත්ත බොජ්ඣංග ධර්මයි.
    5. පසළොස් චරණ ධර්මයි.

23. බුද්ධ ශාසනය තුළ ඒ ඒ අවස්ථාවන්හි සිදු වූ සිදුවීම් මුල්කරගෙන විනය නීති පනවා ඇත. විනය නීති කැඩීම නිසා භික්ෂූන්ට ලබා දිය යුතු විවිධ දණ්ඩන ක්‍රම ද බුදුහු පෙන්වා දුන්හ. 'නුසුදුසු පරිදි ගිහියන් ඇසුරු කරන භික්ෂුවට' ශාසනික වශයෙන් ලබාදෙන දඬුවම හඳුන්වා ඇත්තේ,
    1. පටිසාරණීය කර්මය ලෙස ය.
    2. තජ්ජනීය කර්මය ලෙස ය.
    3. නිස්සය කර්මය ලෙස ය.
    4. බ්‍රහ්මදණ්ඩනය ලෙස ය.
    5. උක්ඛේපනීය කර්මය ලෙස ය.

24. ධර්ම සංගායනා සංකල්පය බුද්ධ පරිනිර්වාණයෙන් පසුව සිදු වූවත් එහි ආරම්භය බුද්ධ කාලය දක්වා දිව යන්නකි. නිගණ්ඨ සසුනේ ඇති වූ සිදුවීම් මුල්කරගෙන අනාගතයේ සසුනට විය හැකි දෝෂයන් මගහරවා ගැනීමට ශ්‍රාවකයන් සූදානම් කිරීම එහි අරමුණයි. විශේෂ වශයෙන් සංගායනා හා සම්බන්ධ බුද්ධ කාලීන ප්‍රවෘතීන් පිළිබඳ සඳහන් සූත්‍ර කීපයක් දක්වා ඇත. එම සූත්‍ර නිවැරදිව දැක්වෙන පේළිය වන්නේ,
    1. ලක්ඛණ සූත්‍රය, පාසාදික සූත්‍රය, අට්ඨකනාගර සූත්‍රය
    2. සංගීති සූත්‍රය, පාසාදික සූත්‍රය, දසුත්තර සූත්‍රය
    3. සද්ධම්ම සම්මෝස සූත්‍රය, සේඛ පරිහානිය සූත්‍රය, සංගීති සූත්‍රය
    4. සංගාම සූත්‍රය, සාමගාම සූත්‍රය, දසුත්තර සූත්‍රය
    5. දසධම්ම සූත්‍රය, සීහනාද සූත්‍රය, ජාලිය සූත්‍රය

25. විවිධ ස්ථානයන්හි තිබූ බුද්ධ වචනය ගුරුකුල වලට පැවරීම පළමු සංගීතියේ සුවිශේෂී සිදුවීමකි. ධර්ම විනය ග්‍රන්ථාරූඪ කරන කාලය දක්වා පැවතියේ එම ගුරුකුල වලට අයත් ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර යටතේ ය. එම පැවරීම අනුව 'මජ්ඣිම නිකාය' භාර වී තිබූ ගුරුකලය වුයේ,
    1. ආනන්ද මහතෙරුන් ප්‍රධාන පරපුරට ය.
    2. මහකසුප් මහතෙරුන් ප්‍රධාන පරපුරට ය.
    3. අනුරුද්ධ මහතෙරුන් ප්‍රධාන පරපුරට ය.
    4. සැරියුත් මහතෙරුන්ගේ ශිෂ්‍ය පරපුරට ය.
    5. උපාලි මහතෙරුන් ප්‍රධාන පරපුරට ය.

26. දේශ කාල ජාති වශයෙන් භේදයක් නොමැතිව සෑම අංශයක් කෙරෙහි ඒකාකාරව බලපාන ධර්මතාවක් වන්නේ 'ත්‍රිලක්ෂණයයි.' එයින් ගැලවුණු තැනක් ලෝකයේ නැත. මේවා හඳුන්වා ඇත්තේ 'ධර්මතා' නමිනි. ධර්මතාවන් කිසිදා නොවෙනස් ව පවතී. බුදුවරයෙකුගේ ආගමනයේ මූලික අභිප්‍රාය ත්‍රිලක්ෂණය පැහැදිලි කිරීම බව ධර්මයේ දැක්වේ. මේ අනුව ගත්විට ත්‍රිලක්ෂණය පිළිබඳ වැරදි අර්ථකථනයක් වන්නේ,
    1. භවත්‍රයටම පොදුවේ බලපාන ධර්තාවකි.
    2. ආකාසානඤ්චායතනයට ගිය පසු ත්‍රිලක්ෂණයෙන් ගැලවිය හැකිය.
    3. පස්වග මහණුන් රහත් වූයේ ත්‍රිලක්ෂණය මුසු වූ ධර්ම පරියායක් සවන් දීමෙනි.
    4. ත්‍රිලක්ෂණය වරදවා වටහා ගැනීම බුදුරදුන් විපල්ලාසයක් ලෙස වදාරා ඇත.
    5. ආනෙඤ්ජ සප්පාය සූත්‍රය තුළ ත්‍රිලක්ෂණයේ සාර්වභෞමිකත්වය පැහැදිලි කොට ඇත.

27. ස්කන්ධ විභාගය තුළ විඤ්ඤාණය සුවිශේෂී කාර්යයක් ඉටු කරයි. විජානන හෙවත් යමක් පිළිබඳ දැනගැනීම විඤ්ඤාණය තුළින් සිදු වේ. මේ අනුව විඤ්ඤාණ ක්‍රියාකාරීත්වයක් සිදුවීමට අවශ්‍ය වන්නේ,
    1. සංස්කාරයන් විඤ්ඤාණයට ප්‍රත්‍ය වීමයි.
    2. ඉඳුරන් සම්බන්ධව උපාදානයක් ක්‍රියාත්මක වීම තුළයි.
    3. ඉන්ද්‍රිය හා අරමුණ එකිනෙක මුණගැසීමයි.
    4. තණ්හාව විඤ්ඤාණයට බලපෑම් කරන විටදී ය.
    5. අපරිභින්න වූ චක්ෂුවක් ඇති කල්හි ය.

28. සච්චක යනු උග්‍ර ආත්මවාදී අදහස් දැරූ පුද්ගලයෙකි. වහසිබස් කියමින් පැමිණ බුදුරදුන් හා ආත්මවාදය පිළිබඳ දීර්ඝ වාදයක් ඇතිකර ගත්තේ ය. වාදය අවසානයේ සච්චක,
    1. බෞද්ධ උපාසකයෙක් බවට පත්විය.
    2. ආත්මවාදය පිළිබඳ තම මතය අත් නොහළේ ය.
    3. බුදුරදුන්ට සිරුර පෙන්වා මාගේ සිරුරේ දහඩිය නැතැ'යි පැවසීය.
    4. තමා සිතන දේ ආත්ම නොවන බව වටහා ගත්තේ ය.
    5. දේශනාව අවසානයේ උතුම් රහත් භාවයට පත්විය.

29. "යමෙක් වනාහි ආක්‍රෝශ කරන්නහුට පෙරළා ආක්‍රෝශ කරයිද, පරුෂ වචන කියන්නහුට පෙරළා පරුෂ වචන කියයිද, බණින්නහුට පෙරළා බණීද, බමුණ, එබඳු තැනැත්තේ එකතුව වළඳන්නේය, කළහු අනුව කරන්නේයයි කියනු ලැබේ. තා බිණූ ඒ ආක්‍රෝශාදිය අපි තා හා (හවුලේ) නොබුදිමු. තා අනුව නොකරමු බමුණ, මෙය (තා කළ දේ) තටම වෙයි. බමුණ, මෙය (තා කළ දේ) තටම වෙයි." මෙම ප්‍රකාශය සිදුකළේ
    1. ආලවකට ය.
    2. මාගන්දියා ට ය.
    3. අක්කෝස භාරද්වාජට ය.
    4. වච්ඡගොත්ත බමුණාට ය.
    5. උදය බමුණාට ය.

30. සත්ත්ව ලෝකයට මෙත් සහගත ආකල්පය පැතිරවීම බුදුදහමේ අරමුණයි. ශුද්‍ර ජීවියාගේ සිට විශාල සත්ත්වයා දක්වා එම ආකල්පය පැතිර වියයුතු බවට බුදුදහම උපදෙස් ලබා දෙයි. කිසිවෙකුගේ හෝ දිවි තොර කිරීමේ අයිතිය කිසිවෙකුට ලබා දී නොමැත. බුදුදහමේ එම ආකල්පය හා නො සැසඳෙන පාඨය වන්නේ,
    1. 'අත්තූපමාය සබ්බේසං සත්තානං හිත කාමතා'
    2. 'අත්තදීපා විහරථ, භික්ඛවේ අත්ත සරණා නාඤ්ඤසරණා'
    3. 'සබ්බේ භද්‍රානි පස්සන්තු මා කඤ්චි පාපමාගමා'
    4. 'අත්තනෝ පාණාතිපාතා පටිවිරතෝ පරඤ්ච පාණාතිපාති වේරමණියා සමාදපේති'
    5. 'සමණෝ න හෝති පරං විහේඨයන්තෝ'

31. බුදුදහමේ ප්‍රමුඛ ඉගැන්වීමක් වන්නේ චතුරාර්ය සත්‍යයයි. බුදුන් වහන්සේගේ පළමු දම් දෙසුම වන්නේ ද එයයි. සත්‍යය සතරේ ඇති ස්වභාවය අනුව ඒවා පිළිබඳ පිළිපැදිය යුතු ආකාරය පෙන්වා දෙන බුදුදහම 'දුක්ඛ නිරෝධ සත්‍යය' පිළිබඳ දරණ අදහස වන්නේ,
    1. එය වැඩිය යුත්තක් ලෙස ය.
    2. එය අතහැර දැමිය යුත්තක් ලෙස ය.
    2. එයට අනුගත ව කටයුතු කරන ලෙස ය.
    4. එය දැනගත යුත්තක් ලෙස ය.
    5. එය සාක්ෂාත් කළ යුත්තක් ලෙස ය.

32. බුදුදහම නිවන දක්වා ඇත්තේ සෑම විටම නිශේධාර්ථවත් පද වලිනි. එයට හේතුව වන්නේ නිවන යනු ප්‍රත්‍යයන්ගෙන් නොකළ නිසාය. ඉතිවුත්තක පාළියේ 'අජාත සූත්‍රයට' අනුව ගත්කළ නිවන හැඳින්වෙන වචනයක් වන්නේ,
    1. 'අකම්පිත' යන්නයි
    2. 'අභූත' යන්නයි.
    3. 'අකප්පිය' යන්නයි.
    4. 'අසයංකාර' යන්නයි.
    5. 'අභේදනීය' යන්නයි.

33. බුදුදහමේ පෙන්වා දෙන ආර්ය මාර්ගය දුක්ඛ නිරෝධයට හේතුවන ප්‍රතිපදාව වේ. මෙය ගොඩනැඟී ඇත්තේ 'ත්‍රිශික්ෂාව' පදනම් කරගෙන බව 'චූලවේදල්ල සූත්‍රයේ' සඳහන් වේ. ආර්ය මාර්ගය ත්‍රිලක්ෂණය හා වර්ග කිරීමේදී ප්‍රඥා ස්කන්ධය නියෝජනය කරන්නේ,
    1. සම්මා සමාධි හා සම්මා දිට්ඨියයි.
    2. සම්මා සංකප්ප, සම්මා වායාම හා සම්මා කම්මන්තයයි.
    3. සම්මා දිට්ඨි හා සම්මා සංකප්පයයි.
    4. සම්මා සති හා සම්මා වායාමයයි.
    5. සම්මා ඤාණ හා සම්මා විමුත්තියයි.

34. ආර්ය මාර්ගය ලෞකික හා ලෝකෝත්තර යන ක්‍රම දෙකට ම දියුණු කළ හැකි බව 'මහාචත්තාරීසක සූත්‍රයේ' දක්වා ඇත. ඒ නිසා ආර්ය මාර්ගය යනු සමාජීය වශයෙන් ද ඉතා සුවිශේෂී වූවකි. ආර්ය මාර්ගයේ මුල් අංගයන් ලෞකික ව දියුණු කිරීමේ දී සුවිශේෂී මෙහෙයක් කරන අංග තුනක් මූලාශ්‍ර දේශනාව තුළ දක්වා ඇත. එම අංග තුන ලෙස දැක්වෙන්නේ,
    1. 'සම්මා සංකප්ප, සම්මා ආජීව හා සම්මා සමාධි' යන්නයි.
    2. 'සම්මා දිට්ඨි, සම්මා සමාධි හා සම්මා සති' යන්නයි.
    3. 'සම්මා කම්මන්ත, සම්මා ආජීව හා සම්මා වායාම' යන්නයි.
    4. 'සම්මා දිට්ඨි, සම්මා වායාම හා සම්මා සති' යන්නයි.
    5. 'සම්මා ඤාණ, සම්මා විමුත්ත හා සම්මා දිට්ඨි' යන්නයි.

35. බුද්ධ කාලීන භාරතය දෘෂ්ටිවාද බොහොමයක් බිහිවූ වකානුවකි. මහණ බමුණන් තුළ තිබූ ඤාණ සම්භාරයන්වල ප්‍රමාණය අනුව දෘෂ්ටි ප්‍රමාණයත් සංවර්ධනය වී ඇත. ඒවා 'ශාස්වත හා උච්ඡේද' වශයෙන් කොටස් දෙකක් නියෝජනය කළේය. මෙයින් 'උච්ඡේද දෘෂ්ටි' බිහිවීමට පදනම් වී තිබුණේ,
    1. හෙතෙම කරයි හෙතෙම විඳියි යන දැක්මයි.
    2. හේතු ප්‍රත්‍ය රහිතව සියල්ල සිදුවන බව පිළිගැනීමයි.
    3. ජීවය එකකි. ශරීරය අනිකකි යන පිළිගැනීමයි.
    4. කිසිවක් කිරීමෙන් ප්‍රයෝජනයක් නොමැත යන අකිරියවාදී දැක්මයි.
    5. ජීවයත් ශරීරයත් දෙකම එකක් ලෙස පිළිගත් නිසා ය.

36. මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වා දෙන බුදුදහම 'ආර්ය ශ්‍රාවකයා පංචවිධ වූ භයෙන් සන්සිඳීමෙන් ද සිව් සෝතාපත්ති අංග ප්‍රගුණ කිරීමෙන් ද පටිච්චසමුප්පාදය මැනවින් දැකීමෙන් ද තමා විසින් ම තමා නිරයගාමී නොවන සෝතාපන්නයෙකු බවට ප්‍රකාශ කළ හැකි බව' සඳහන් කරයි. මිනිසාගේ ස්වාමියා සිටින්නේ මිනිසා තුළ ම බව ඒ අනුව පසක් වේ. 'සංයුත්ත නිකායේ පංචභයවේර සූත්‍රයේ' දැක්වෙන ආකාරයට ආර්ය ශ්‍රාවකයා ප්‍රගුණ කරන සෝතාපත්ති අංගයක් වන්නේ,
    1. අරියකන්ත ශීලයෙන් සමන්විත වීමයි.
    2. සත්පුරුෂ සේවනයෙන් යුක්ත වීමයි.
    3. සද්ධර්මය ශ්‍රවනය කිරීමයි.
    4. සියලු සත්ත්වයා කෙරෙහි මෙත් වැඩීමයි.
    5. පංචවිධ බල ධර්ම දියුණු කිරීමයි.

37. '**මනසා චෙ පදුට්ඨේන භාසති වා කරෝති වා තතෝ නං දුක්ඛමන්වේති**' යනුවෙන් දැක්වෙන පාඨය සැමට හුරුපුරුදු ය. මෙහි අදහස වන්නේ ප්‍රදුෂ්‍ය සිතින් කරන කියන කටයුත්තේ අයහපත් ප්‍රතිඵල පුද්ගලයාට විඳින්නට සිදුවන ආකාරයයි. මෙමගින් ගම්‍ය වන්නේ,
1. පුද්ගලයාගේ ඇති ශ්‍රේෂ්ඨත්වයයි.
2. සිත සියල්ලට ම ප්‍රධාන වන බවයි.
3. ලෝකය පාලනය කරන්නේ සිතට අනුව බවයි.
4. ක්‍රියාවේ වගකීම කතෘට පැවරෙන බවයි.
5. ක්‍රියාව හා වගකීම යනු දෙකක් බවයි.

38. දිනක් සෝමපාල මහතා ගමේ විහාරස්ථානයේ මහත් අභිමානයෙන් යුක්තව වාර්ෂික කඨින පිංකම සිදු කළේය. බොහෝ දෙනා ඒ පිළිබඳ සෝමපාල මහතාට ප්‍රශංසා කළහ. ඊළඟ පෝය දින සිල්ගත් උපාසක උපාසිකාවන් අතර ද මෙම පින්කම පිළිබඳ සාකච්ඡාවක් සිදු වූහ. එහිදී එතන සිටි ඤාණවතී උපාසිකාව 'අනේ සාධු සාධු' කියමින් ඒ පිළිබඳ සතුටු වූහ. එම අවස්ථාවේ ඇය තුළින් විදහා දැක්වුන පින්කිරියවත වන්නේ,
1. 'වෙයාවච්ච' පින්කිරියවත ය.
2. 'දාන' පින්කිරියවත ය.
3. 'පත්ති' පින්කිරියවත ය.
4. 'දිට්ඨිජුකම්ම' පින්කිරියවත ය.
5. 'පත්තානුමෝදනා' පින්කිරියවත ය.

39. ඇතුන් පිළිබඳ දක්ෂ 'නාගවනිකයා' කැලයේ ගමන් කරන විට ඇත් අඩිය දැකීමෙන් පමණක් නොනැවතී ඇතා දකිනතුරු ම ගොස් 'මේ ඉන්නේ මහඇතා ය.' (**ඒසෝ මහානාගෝ**) යන නිෂ්ඨාවට පැමිණිය යුතුය. හත්ථිපද උපමාව මැනවින් සම්පූර්ණ වන්නේ එවිට ය. ආර්ය ශ්‍රාවකයා ද තථාගත පදය දැකීම සඳහා ආදියෙන් නොනැවතී අවසානය දක්වා ම ගමන්කළ යුතු බව මෙම උපමාවෙන් බුදුන් වහන්සේ අවධාරණය කරයි. බෞද්ධ ශ්‍රද්ධාවේ උපයෝගීතාව පෙන්වා දෙන මේ කාරණය සඳහන් වන්නේ,
1. මහා හත්ථිපදෝපම සූත්‍රයේ ය.
2. හත්ථිරාජ සූත්‍රයේ ය.
3. හත්ථිගාම උග්ග සූත්‍රයේ ය.
4. චූල හත්ථිපදෝපම සූත්‍රයේ ය.
5. ජානුස්සෝනි සූත්‍රයේ ය.

40. ශ්‍රද්ධාවේ වැදගත් අවස්ථා දෙකක් ලෙස '**ශ්‍රද්ධානුසාරී හා ධම්මානුසාරී**' අවස්ථා දෙක දැක්විය හැකිය. නිවන් මාර්ගයේ වටිනා සන්ධිස්ථාන දෙකක් ලෙස මෙය හැඳින්විය හැකිය. බුදුදහමේ පෙන්වා දෙන අන්දමට ශ්‍රද්ධානුසාරී අවස්ථාව පිළිබඳ දැක්විය හැකි නිගමනයක් වන්නේ,
1. ශ්‍රද්ධාවේ නිශ්ඨාවට ගිය අවස්ථාවයි.
2. ශ්‍රද්ධාව බිඳකුදු වැඩී නොමැති අවස්ථාවයි.
3. ශ්‍රද්ධා මාත්‍රයක් ප්‍රේම මාත්‍රයක් සහිත අවස්ථාවයි.
4. බුදුරදුන් පිළිබඳ ගැඹුරු අවබෝධයක් ඇති අවස්ථාවකි.
5. සෝතාපන්න තත්ත්වයට පත් අවස්ථාවයි.

41. ධනෝපායනය කාමභෝගියෙකු විසින් ස්වකීය පැවැත්ම වෙනුවෙන් සිදුකළ යුත්තකි. නමුත් එය සිදුකළ යුත්තේ ධාර්මික පදනමකින් යුක්තවයි. ඒ සඳහා උපදේශයන් ලබාදෙන බුද්ධ දේශනා රාශියක් පෙළ දහමේ දැක්වේ. ධනය ඉපයීමේදී සැහැසි නොවී සිදුකළ යුතු ඉපයීම පිළිබඳ කරුණක් දැක්වෙන සූත්‍ර දේශනාවක් වන්නේ,
1. අලගද්දූපම සූත්‍රයයි.
2. සිඟාලෝවාද සූත්‍රයයි.
3. පත්තකම්ම සූත්‍රයයි.
4. ඉණ සූත්‍රයයි.
5. රාසිය සූත්‍රයයි.

42. ධන පරිභෝජන ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු 'පංචබලි' සංකල්පයක් බුදුදහම පෙන්වා දී ඇත. බලි යන්නෙන් අදහස් වන්නේ 'යුතුකම්' යන්නයි. මේ පිළිබඳ සිදුකළ දේශනාව කවරෙකු අරභයා දේශනා කරන ලද්දක් ද?
    1. විශාඛා සිටු දේවිය අරභයා ය.
    2. සිගාල සිටු පුත්‍රයා අරභයා ය.
    3. උග්ගමහාමත්තයන් අරභයා ය.
    4. සුදත්ත සිටුවරයා අරභයා ය.
    5. රජගහනුවර සිටුවරයා අරභයා ය.

43. 12 වසරේ බුද්ධ ධර්මය උගන්වන ගුරුතුමා දිනක් 'බුදුදහමේ ආර්ථික ක්‍රියාවලිය' යන මාතෘකාව යටතේ කෙටි වාක්‍ය දහයක් ලිවීමට සිසුන්ට ලබාදුන් පැවරුමට 'චන්දිමා නිරෝෂණී' ශිෂ්‍යාව ලියූ වාක්‍ය කීපයක් පහතින් දක්වා ඇත. එයින් එක් වාක්‍යයක දෝෂයක් ඇතැ'යි ගුරුතුමා පවසන්නට විය. ඇය ලියා තිබූ දෝෂ සහිත වාක්‍යය ලෙස නිගමන කළ හැක්කේ,
    1. ආර්ථිකය ධාර්මිකව උපයන්නාගේ ධනය දියුණු වන්නේ තුඹසක් වැඩෙන්නාක් මෙනි.
    2. උපයන්නා වූ ධනයෙන් කොටස් දෙකක් වැය කළ යුත්තේ ආයෝජනය සඳහා ය.
    3. උපයන ධනයෙන් බලි පහක් සිද්ධ කළ යුතු බවට ගාමිණී නැමැත්තාට පෙන්වා දී ඇත.
    4. ධන පරිභෝජනයේ දී ස්වර්ග සංවත්තනික වන දක්ෂිණාව ද පිහිටුවිය යුතුය.
    5. ආර්ථිකය පදනම් වූ ජීවන පැවැත්මක් ඇත්තා නිස්සරණ ප්‍රඥාවෙන් ක්‍රියා කරන්නෙකි.

44. ආර්ථික හා සම්බන්ධව දේශිත බුද්ධ දේශනාවල දී '**තුලාධාර, උදුම්බර ඛාදක හා තලාක**' යන උපමා භාවිතා කරමින් ආර්ථිකය පිළිබඳ බෞද්ධ උපදේශනය ලබා දී ඇත. ඒ අනුව කරුණු සලකා බැලීමේ දී බුදුන් වහන්සේ 'තලාකෝපමාව' භාවිතා කොට ඇත්තේ,
    1. ආර්ථික සුරක්ෂිතතාව පැහැදිලි කිරීමටයි.
    2. අය වැය සමව පවත්වාගැනීම පැහැදිලි කිරීමටයි.
    3. ආපදාවකදී කටයුතු කළයුතු ආකාරය පැහැදිලි කිරීමටයි.
    4. ධනය උපයන ආකාරය පැහැදිලි කිරීමටයි.
    5. ආර්ථික කළමනාකරණය පැහැදිලි කිරීමටයි.

45. බුදුදහම පැවති යුගයේ රාජ්‍ය පාලනය ක්‍රම දෙකක් ඔස්සේ ව්‍යාප්ත වී තිබුණි. ඒ 'රාජාණ්ඩු හා සමූහාණ්ඩු' වශයෙනි. ප්‍රධාන පාලකයෙකු රාජාණ්ඩුව පාලනය කළ අතර කොමිටියක් මගින් සමූහාණ්ඩුවේ කාර්යයන් ක්‍රියාත්මක වූහ. බුද්ධ කාලය වන විට එවන් රාජාණ්ඩු හතරක් තිබූ බව තොරතුරුවල දැක්වේ. එම රාජාණ්ඩුවක් නම්,
    1. කපිලවස්තුව
    2. කුසිනාරාව
    3. වත්ස ය.
    4. විශාලාව
    5. සැවැත් නුවර

46. රාජ්‍ය පාලනය පිළිබඳ 'දස සක්විති වත්' පෙන්වා දෙන සූත්‍ර දේශනාව වන්නේ 'චක්කවත්ති සීහනාද සූත්‍රයයි.' පාලකයකු පිළිපැදිය යුතු රාජ ධර්ම දහයක් එහි සාකච්ඡා කොට ඇත. සමබර පාලනයක් සඳහා අවශ්‍යයෙන් ම පිළැපැදිය යුතු එවන් සක්විති වතක් වන්නේ,
    1. කාන්තාවන්ට ධාර්මික ආරක්ෂාව සැලසීමයි.
    2. අගතිගාමීත්වයෙන් තොර යහපත් තීරණ ගැනීමයි.
    3. පඤ්චශීල ප්‍රතිපදාව ආරක්ෂා කිරීමයි.
    4. මහණ බමුණන් හමු වී යහපත අයහපත විචාරීමයි.
    5. පූජනීය ස්ථාන මැනවින් ආරක්ෂා කිරීමයි.

47. පසුගිය පොසොන් පෝදා ශීල සමාදානයට පැමිණි උවසු උවැසියන් අතර 'සමථ භාවනාව' පිළිබඳ පළ වූ අදහස් කීපයක් පහතින් දැක්වේ. එයින් නිවැරදි වූයේ හතරක් පමණි.
    1. චිත්ත සමාධිය ඇති කර ගැනීම සමථ භාවනාවේ කාර්යයි.
    2. නීවරණයන් සහමුලින් නැසීමට සමථ භාවනාව උපකාරී වේ.
    3. සමථ භාවනාව අයත් වන්නේ විෂ්කම්භන ප්‍රහාණයටයි.
    4. ආළාර කාලාමයන් ධ්‍යාන ලබා තිබුණේ සමථ භාවනාවෙනි.
    5. පංච අභිඥාවන් ලබා ගැනීමට සමථය වැඩීමෙන් හැකියාව ලැබේ.

48. පුද්ගලයාට ඇති වටිනා ආරක්ෂණ විධි හතරක් ලෙස 'චතුරාරක්ඛා' හඳුන්වාදිය හැකිය. මෙම කරුණු මෙනෙහි කරන්නාට දිට්ඨධම්මිකව හා සම්පරායික ව ඇතිවිය හැකි බිය තුරන් වී ජීවිතයට නොබියව මුහුණ දීමේ හැකියාව ලැබෙයි. පහත දැක්වෙන කාරණා අතරින් සතර කමටහන් වලට ඇතුළත් වන්නේ,

1. සීලානුස්සති
2. උපසමානුස්සති
3. අසුභානුස්සති
4. දේවතානුස්සති
5. ධම්මානුස්සති

49. භාවනා කරන යෝගාවචරයාට මගපෙන්වීමට කර්මස්ථාන ආචාර්යවරයෙකු අවශ්‍ය වේ. භාවනාව සඵල වීමට එය විශාල දායකත්වයක් සපයයි. විසුද්ධි මාර්ගය ආදී භාවනාවට උපදෙස් ලබා දෙන ග්‍රන්ථවල ඒ පිළිබඳ දක්වා ඇත. එම විග්‍රහයට අනුව කර්මස්ථාන ආචාර්යවරයෙකු සතු ගුණාංගයක් වන්නේ,

1. මනා දැකුම්කලු භාවයක් තිබීමයි.
2. අස්ථානයේ නොයොදන්නෙක් වීමයි.
3. කථාවේ දක්ෂයෙක් වීමයි.
4. සසර බිය දකින්නෙක් වීමයි.
5. ශ්‍රද්ධාවන්තයෙකු වීමයි.

50. පුද්ගලයා සාමාන්‍ය වශයෙන් චරිත 'හයකට' බෙදා දක්වයි.'රාග, දෝස, මෝහ, සද්ධා, බුද්ධි, විතක්ක' වශයෙන් ඒවා දක්වා ඇත. පුද්ගල චරිත දැනගෙන ආචාර්යවරයා කමටහන් ලබා දිය යුතුය. ඒ පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ගුරුවරයා සතුවිය යුතුය. චරිතානුකූලව කමටහන් ලබා දීමේදී 'විතක්ක චරිතයාට' ලබාදිය යුතු කමටහන ලෙස නිර්දේශ කර ඇත්තේ,

1. ආනාපානසති භාවනාවයි.
2. චතුධාතු වවත්ථානයි.
3. සතර බ්‍රහ්ම විහරණයි.
4. කායගතාසතියයි.
5. මෛත්‍රී භාවනාවයි.